// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2379/27 – 2024 අප්‍රේල් මස 10 වැනි බදාදා – 2024.04.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2021/99.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ආර්. පී. පී. ජයකොඩි මයා, අංක 233/1, රුවන්පුර, රුක්මලේ, වේයන්ගොඩ.

සහ

සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලය, 19 - 23 මහල්. ''මෙහෙවර පියෙස'', නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාර අංක 117 හි, සිරි සිංගප්පුලි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනුෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

1A – G 041751 – 09 (2024/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/03/2021/99.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ආර්. පී. පී. ජයකොඩි මයා, අංක 233/1, රුවන්පුර, රුක්මලේ, වේයන්ගොඩ.

සහ

සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් මණ්ඩලය, 19 - 23 මහල්. ''මෙහෙවර පියෙස'', නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

''සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සේවය කරන ආර්. පී. ජයකොඩි මහතාට ඔහුගේ සේවය අත්හිටවූ කාලයට (2006.06.07 සිට 2017.01.04 දක්වා කාලයට) වැටුප් සහිතව රැකියාවේ පිහිටුවා ඇති නමුත් එම කාළයට අදාළව,

- ප්‍රසාද දීමනා හා දිරි දීමනා හිමි ද? හිමි නම් එය ලබා නොදීම.
- උසස්වීම් හිමි ද? හිමිනම් එය ලබා නොදීම.
- වෙනත් හිමිකම් හා වරප්‍රසාද පවතී නම්, ඒවා ලබා නොදීම.

මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.''

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (වැ.බ.).

2024 මාර්තු මස 11 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 04 - 0116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.